**ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2017**

**--------------------------------------------------------------**

ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 18(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2018 ජූලි 30 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.7,790,035 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,540,930 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.750,895 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සභාවේ මුළු ආදායම රු.11,632,963 කින් අඩු වුවද, නිවාස ආධාර වියදම රු.13,938,540 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

**4.1.1** **ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ සඳහන් අරමුණු 22 ක අතුරින් පහත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- (i) ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ලබාදිය හැකි සේවා සම්බන්ධයෙන් නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම
- (ii) ආබාධවලට ප්‍රධාන හේතු දැනගැනීම හා ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායී පියවර ප්‍රවර්ධනය කිරීම
- (iii) ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සළසා අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබාදීම සහ ඔවුන් වෙනුවෙන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම

**(ආ)** **ආධාරක උපකරණ බෙදාදීම**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම අනුව රු.1,625,000 ක ප්‍රතිපාදන මත ආබාධිත පුද්ගලයන් වෙත ජංගම සේවා මගින් ඇස්කණ්නාඩි 2,500 ක් බෙදාදීමට සැළසුම් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය තුල ලබාදී තිබුණේ රු.456,300 ක් වටිනා ඇස් කණ්නාඩි 565 ක් පමණක් විය.

**(ඇ) ආබාධිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීම**

ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් සියයට 5 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක අඩු ආදායම්ලාභී නිවාස නොමැති ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීමේ වැඩසටහනට අදාලව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැළැස්ම අනුව රු. 60,000,000 ක ප්‍රතිපාදන මත ආබාධිත පුද්ගලයන් 700 දෙනෙකුට නිවාස ආධාර ලබාදීමට සැළසුම් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය තුලදී නිවාස ආධාර ලාභීන් 389 දෙනෙකු වෙත රු.36,406,521 ක් පමණක් ලබා දී තිබුණි. එයින්ද නිවාස ආධාර ලාභීන් 315 දෙනෙකු වෙත ගෙවා තිබූ රු. 29,394,672 ක් පසුගිය වර්ෂවලට අදාල හිඟවාරික ගෙවීම් විය.

(ii) දිස්ත්‍රික්ක 19 ක නිවාස ආධාරලාභීන් 93 දෙනෙකු සඳහා නිවාස ආධාර වශයෙන් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලයට අදාලව අනුමත වූ රු.15,803,000 ක මුදලින් පළමු වාරික වශයෙන් රු.7,296,000 ක මුදලක් අදාල වර්ෂවලදී ගෙවා ඇති නමුත් ප්‍රමාණවත් පරිදි අරමුදල් නොලැබීම සහ ගෙවිය යුතු නිවාස ආධාර වාරික තිබියදී නව නිවාස ආධාරලාභීන් හඳුනා ගැනීම වැනි හේතු නිසා තවදුරටත් ආධාරලාභීන් වෙත රු. 8,507,000 ක් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව වර්ෂ 02 ත් වර්ෂ 10 ත් අතර ප්‍රමාද කාලයක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිරීක්ෂණය විය.

**(ඈ) ආදායම් උත්පාදනය සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම**

ආබාධිත පුද්ගලයන් සිටින අඩු ආදායම්ලාභී පවුල්වලට ආර්ථික තත්ත්වය පහසු කරගැනිම සඳහා ස්වයං රැකියා වැඩිදියුණු කිරිම හෝ ආරම්භ කිරීමට රු.10,000 ත් රු.25,000 ක් අතර මුදලක් පුද්ගලයන් 360 දෙනෙකුට ලබාදීමට රු.10,000,000 ක ප්‍රතිපාදන සළස්වා තිබුණි. ඒ අනුව ආබාධිත පුද්ගලයන් 422 දෙනෙකුට රු9,987,610 ක් ලබාදී තිබුණි. මේ සම්බන්ධව ඍජු අධීක්ෂණයක් සිදුකර ප්‍රගති වාර්තා ආබාධිත තැනැත්තන් සඳහාවූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලිඛිතව උපදෙස් ලබා දී තිබුණද, ස්වයං රැකියාලාභීන් 199 දෙනෙකුගේ ප්‍රගති වාර්තා විගණන දිනය වූ 2018 ජූලි 31 දින වන විටත් ලබා දී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුව, 2006 ඔක්තෝබර් 17 දිනැති අංක 1467/15 සහ 2009 සැප්තැම්බර් 18 දිනැති අංක 1619/24 දරන අතිවිශේෂ ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත්කර ඇති 2006 අංක 01 දරන ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග ප්‍රකාරව දැනට පවතින සියළුම ප්‍රසිද්ධ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා පොදු සේවා ලබාදෙන ස්ථාන සඳහා ආබාධිත තැනැත්තන්ට ප්‍රවේශවීමට හැකිවන ආකාරයට ඉදිකිරීම් සිදුකළ යුතුව ඇත. අදාල ගැසට් නිවේදනය නිකුත් කර වර්ෂ 09 ක් පමණ ගතව ඇතත් එපරිදි අදාල ඉදිකිරීම් සිදුකර ඇත්ද යන්න පරීක්ෂා කර වාර්තා කිරීම ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි.

(ආ) ආබාධිත තැනැත්තන් සඳහාවූ ජාතික මහ ලේකම් කාර්යාලය විසින් නිවාස ආධාර ලබාදීම ආරම්භ කරන ලද 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම දිස්ත්‍රික්ක වශයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙන් හෝ ආබාධිත පුද්ගලයන්ට ගෙවන ලද නිවාස ආධාරවලට අදාලව ගෙවූ වාරික සංඛ්‍යාව, ගෙවිය යුතු වාරික සංඛ්‍යාව ඉදිකර අවසන් මුළු නිවාස සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ආබාධිත පුද්ගලයින් 2,116 දෙනෙකු ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙතින් නිවාස ආධාර ඉල්ලුම්කර තිබුණු නමුත් එම ඉල්ලුම්කරුවන් සඳහා පොරොත්තු ලේඛණයක් සකස් කර නොතිබුණු අතර නිවාස ආධාර වාරික 03 ම ගෙවා අවසන් වූ පසු ඒ සම්බන්ධයෙන් පසු විපරම් සිදු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය පාලනය

සභාව වෙනුවෙන් 2017 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර රේඛීය අමාත්‍යාංශය යටතේ විසර්ජන ගිණුමෙන් නිදහස් කරන ලද ප්‍රතිපාදිත අරමුදල් භාවිතා කිරීමක් සිදුව තිබුණි. එහෙයින් කළමනාකරණ පාලන කාරකයක් ලෙස අයවැයක් භාවිතා කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ජාතික සභාවේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකර ඇති අතර නිවාස ආධාර ලබාදීම කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.